රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிருவாக மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION & DISASTER MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site

මගේ අංකය / எனது இல / My No: COM/Trans/වා.ස්.මා./2019

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2019.03.05

අමාත්‍යාංශ ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**<u>ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2019</u>**

ඒකාබද්ධ සේවාවන් සම්බන්ධයෙන් වූ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම එම සේවාවන් සඳහා වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලය අභිනියෝජිත බලධරයා ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී ඇත්තේය. ඒ අනුව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතු ආකාරය සඳහන් අංක:1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ විධිවිධාන අනුව 2019 වර්ෂය සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

02. එහෙත් එම වාර්ෂික ස්ථාන මාරු නියෝග නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව වාර්තා වී ඇති අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/APL/1/AT/2018 හා 2019.01.24 දිනැති ලිපියෙන්, 2019 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2018.07.11 දිනැති අංක:03/2018 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන වලට අනුකූලව කටයුතු කළයුතු බවටත්, වාර්ෂික ස්ථාන මාරු නියෝගය මත නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරිය සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු බවත් දන්වා ඇත.

03. වාර්ෂික ස්ථාන මාරු නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සියළුම දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් වන අතර, ඒ සම්බන්ධයෙන් 2018.07.11 දිනැති අංක:03/2018 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛයෙහි අංක:09 වගන්තිය යටතේ දක්වා ඇති **"වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම"** යටතේ 9.1 සිට 9.8 දක්වා වූ කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලබන අතර, පහසු අවධානය සඳහා 9.3 හා 9.4 වගන්ති උධෘත කොට පහත දක්වා ඇත.

“ 9.3.වාර්ෂික ස්ථාන මාරු නියෝග මගින් අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථානමාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාරගැනීමට හැකි වන සේ ඔවුන් මුදාහැරීමට කටයුතු කළ යුතු ය. මෙම විධිවිධානවලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ.

9.4 ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක නොවන්නේ නම්, ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක වීමට නියමිත දිනට පසු මාසයේ සිට අදාල නිලධාරීන්ගේ වැටුප නතර කිරීමට ආයතන ප්‍රධානියා විසින් පියවර ගත යුතුය.”

04. එබැවින් 2019 වර්ෂය වෙනුවෙන් වූ ඒකාබද්ධ සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු නියෝග නියමිත අයුරින්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සියළුම දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් වෙත මෙයින් දන්වනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත:

ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.